A

# නිවේදනය

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙකී පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ (5)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව එක් එක් පළාත් සභාවට යොමු කර 2017 ජනවාරි මස 10 දින සිට මාසයක් ඇතුළත ඒ ඒ පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කරන ලෙස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 46අ (2)(අ) යටතේ ඉල්ලා සිටින ලදී.

පළාත් සභාවල අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කර ඇති අතර, ඒවා පහත සඳහන් පරිදි වේ:-

- ඒ අනුව, උතුරු මැද පළාත් සභාව පනත් කෙටුම්පත සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා එකී සභාවේ එකඟතාවය පළ කර ඇත.
- මධ්‍යම, වයඹ, සබරගමුව, දකුණු, බස්නාහිර සහ ඌව යන පළාත් සභා පනත් කෙටුම්පත සලකා බැලීමෙන් අනතුරුව සංශෝධන වලට යටත්ව එකී සභාවල එකඟතාවය පළ කර ඇත.
- උතුරු පළාත් සභාව මෙම පනත් කෙටුම්පත සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා එකඟ වී නොමැති අතර නැගෙනහිර පළාත් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ක්‍රියාත්මක වනතෙක් සලකා බැලීම කල්තබන ලද බව දැනුම් දී ඇත.

එකී පළාත් සභාවල අදහස් ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට ද ආර්ථික සංවර්ධන ආංශික අධීක්ෂණ කාරක සභාවට ද යොමු කරනු ලැබේ.